# මහජනතාව වෙත කෙරෙන නිවේදනයයි

# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

# නවක වධයේ වින්දිතයින් සඳහා සහන සැලසීම

උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන ගරු අමාත්‍යතුමාගේ නියෝගය මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නවක වධයට ගොදුරුවූවන්ට සුදුසු සහනයක් නිර්දේශ කිරීම සහ නවක වධය වැලැක්වීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග යෝජනා කිරීමේ පරමාර්ථය උදෙසා විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයකුගේ ප්‍රධානත්වයෙන් යුත්, සත් සාමාජික විමර්ශන කමිටුවක් පත්කර ඇත.

"රට හදන සෞභාග්‍යයේ දැක්ම" නව සංවර්ධන ප්‍රවේශය යටතේ, උසස් පෙළ විභාගය සමත් සහ විශ්වවිද්‍යාලයට හෝ වෙනත් උසස් අධ්‍යාපන ආයතනයකට සුදුසුකම් ලබන සියලුම සිසුන්ට උසස් අධ්‍යාපන අවස්ථා සලසාදීමේ නව වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සමගාමීව, මෙම පියවර ආරම්භ කර ඇත.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2014 / 2015 අධ්‍යයන වර්ෂයේ සිට 2018 / 2019 අධ්‍යයන වර්ෂය දක්වා විශ්වවිද්‍යාලයකට / උසස් අධ්‍යාපන ආයතනයකට තෝරාගන්නා ලද සහ නවක වධයේ ගොදුරක් බවට පත්ව, එම විශ්වවිද්‍යාලයේ / උසස් අධ්‍යාපන ආයතනයේ බඳවාගැනීමෙන් වැළකුණු හෝ නවක වධය හේතුවෙන් ඔවුන්ගේ උසස් අධ්‍යාපන කටයුතු අත්හිටුවීමට සිදුවූ සිසුන්ට සහන සැලසීම සඳහා අයදුම්පත්‍ර කැඳවීමට මෙම කමිටුව මගින් තීරණය කර ඇත.

ඔබත්, නවක වධයේ ගොදුරක් බවට පත්ව, ඉහත සඳහන් කාලසීමාව ඇතුළත ඔබගේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය ආරම්භ කිරීමේ හෝ සම්පූර්ණ කිරීමේ අවස්ථාව අහිමි වූ සිසුවකු නම්, ඉහත සඳහන් කමිටුව වෙත **2020 පෙබරවාරි 28** වන දිනට හෝ ඊට ප්‍රථම, ඔබගේ සහන සඳහා හිමිකම් ඉල්ලීමට අදාළ ලිපිලේඛන / සාක්ෂි සහිතව දිවුරුම් ප්‍රකාශයක ආකාරයෙන් පහත සඳහන් තොරතුරු සැපයීම මගින් සිදුකළ යුතුය.

**01. ඔබ තේරී පත්වූ / බඳවාගනු ලැබූ විශ්වවිද්‍යාලයේ / උසස් අධ්‍යාපන ආයතනයේ නම :** ..............................................

**02. අධ්‍යයන වර්ෂය :** ..............................................

**03. අධ්‍යයන පාඨමාලාව, පීඨයේ සහ ලියාපදිංචි අංකය :** ..............................................

**04. සම්පූර්ණ නම :** ..............................................

**05. ස්ථිර ලිපිනය :** ..............................................

**06. ඇමතුම් විස්තර :**

**දු.ක. අංකය :** .............................. **ඊ මේල් :** ..............................

**07. විශ්වවිද්‍යාලයෙන් / උසස් අධ්‍යාපන ආයතනය හැර ගිය දිනය (අදාළ වේ නම්)**

ඔබ විසින් සපයන සියලුම තොරතුරු ඉතා රහස්‍ය ලෙස සලකන බව කරුණාවෙන් සලකන්න.

මේ සම්බන්ධව වැඩිදුර තොරතුරු දු.ක. අංක 0113092449 ඇමතීමෙන් ලබාගත හැකිය. (සාමාන්‍ය රාජකාරී දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා)

ඔබගේ සහන ඉල්ලුම් පත්‍රය පහත සඳහන් ලිපිනයට, තැපැල් මාර්ගයෙන් **2020 පෙබරවාරි 28** වන දිනට හෝ ඊට ප්‍රථම යොමු කරන්න. විකල්පයක් ලෙස ඔබගේ අයදුම්පත්‍රය පහත සඳහන් ඊ මේල් ලිපිනයට හෝ ෆැක්ස් අංකය වෙත ද යොමු කළ හැක. එසේ ඊ මේල් හෝ ෆැක්ස් මගින් යොමු කිරීමෙන් පසු අදාළ දිවුරුම් ප්‍රකාශයේ මුල් පිටපත තැපැල් මගින් එවීමට කටයුතු කළ යුතුය.

ඊ මේල් ලිපිනය : ragrelief@gmail.com

ෆැක්ස් අංකය : 0112686041

ඔබගේ අයදුම්පත්‍රය විද්‍යුත් තැපැල් මාර්ගයෙන් (Email) හෝ ෆැක්ස් මාර්ගයෙන් එවන විට, අදාළ ලිපිලේඛනවල මුල් පිටපත් අවශ්‍ය වන විට සැපයිය යුතුය. අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර සලකා බලනු නොලබන බව කරුණාවෙන් සලකන්න.

**තැපැල් ලිපිනය :**

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ මිය,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප සභාපති,
ලේකම්, නවක වධයේ වින්දිතයන් සඳහා සහන සැලසීමේ කමිටුව,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,
නො. 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

2020 පෙබරවාරි 10